**බුලත්සිංහල ප්‍රාදේශීය සභාව**
**කළුතර දිස්ත්‍රික්කය**
------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.
--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 02 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 01 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 10 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය
-------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වල වැදගත් බව හේතුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
----------------------------------------

1:3:1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම
-----------------------------------------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 2 අනුව මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි.

1:3:2 ගිණුම්කරණ ප්‍රතිපත්ති
------------------------

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා සභාව විසින් අනුගමනය කර තිබූ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

1.3.3 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 වර්ෂයේ වැය ලෙජරය අනුව පුස්තකාල පොත් මිලදී ගැනීම් රු.320,325 ක් හා පුස්තකාල පොත් වෙනුවෙන් ගෙවිය යුතු ශේෂය (ණයහිමි) රු.100,000 ක් වූ අතර පුස්තකාල පොත් යටතේ රු.249,580 ක් පමණක් ගිණුම් කර තිබීම නිසා රු.170,745 ක් වූ පුස්තකාල පොත් වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ සාමාන්‍ය තොග මිලදී ගැනීම් සහ ආයුර්වේද තොග මිලදී ගැනීම් පිළිවෙලින් රු.4,724,971 ක් සහ රු.279,635 ක් වැය ගිණුම බැර කිරීම වෙනුවට ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම බැර කර තිබූ අතර එම තොග නිකුත් කිරීම් රු.4,489,408 ක් සහ රු.224,020 ක් වැය ගිණුම හර කිරීම වෙනුවට ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම හර කර තිබීම නිසා වර්ෂයේ වියදම රු.291,178 ක් අඩුවෙන්ද, ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුමේ ශේෂ එම ප්‍රමාණයෙන් වැඩියෙන්ද දක්වා තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂය අවසානයට මුදල් ගිණුමේ (ගිණුම් අංක 002) ශේෂය රු.111,785 ක් අඩුවෙන් ශේෂ පිරික්සුමට ගෙන තිබීමේ වරද නිවැරදි කිරීමේදී එම වටිනාකම අවිනිශ්චිත ගිණුම බැර කළ යුතු වුවත් සමුච්චිත අරමුදල බැර කර තිබුණි.

(ඈ) 2012 වර්ෂයේදී 2013 වර්ෂය වෙනුවෙන් ලැබී කලින් ලැබීම් ගිණුමේ ගිණුම් ගත කර තිබූ වරිපනම් බදු රු.21,560 ක්, අක්කර බදු රු.8,944 ක් හා ව්‍යාපාර බදු රු.6,720 ක් සමාලෝචිත වර්ෂයේදී අදාල

ආදායම් ගිණුම්වලට ගලපා නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේදී 2014 වර්ෂය වෙනුවෙන් ලැබී තිබූ වරිපනම් හා අක්කර බදු රු.34,513 ක් හා රු.4,439 ක් කලින් ලැබීම් ලෙස ගිණුම් ගත නොකර වර්ෂයේ ලැබීම් ලෙස සළකා ගිණුම් ගත කර තිබුණි.

(ඉ) 2013 ජනවාරි මාසයේ ණයහිමි ගෙවීම් රු.1,168,342 ක් 2012 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සැදීමේදී 2012 ණයහිමි ලෙජර ගිණුමට හර කර තිබීමේ වරද සමාලෝචිත වර්ෂයේදී නිවැරදි කිරීමේදී අවිනිශ්චිත ගිණුම හර කළ යුතු වුවත් සමුච්චිත අරමුදල හර කර තිබුණි.

(ඊ) විශ්‍රාම වැටුප්, විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික වියදම් රු.600,000 ක් ආදායම් හා වියදම් ගිණුමට ගිණුම් ගත කර නොතිබුණි.

(උ) ප්‍රවාහන සම්බන්ධතා, ආවශ්‍යක හා වෙනත් සේවා වියදම රු.492,032 ක් ආදායම් හා වියදම් ගිණුමට ගිණුම් ගත කර නොතිබුණි.

(ඌ) ප්‍රාග්ධන වැය රු.114,750 ක් ආදායම් හා වියදම් ගිණුමට අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි.

(එ) ණය පදනම මත පළාත් පාලන කොමසාරිස් වෙතින් ලැබී තිබූ රු.3,178,457 ක් වූ කැබ් රථය සඳහා ගෙවිය යුතු ණය ශේෂය ගිණුම් ගත කර නොතිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂය අවසානයට අවිනිශ්චිත ගිණමේ හර ශේෂය රු.1,486,243 ක් වූ අතර එය නිරවුල් කිරිමට කටයුතු කර නොතිබුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.1,900,052 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,670,959 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

සමාලෝචිත වර්ෂය අවසානයට සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂය රු.3,257,778 ක හර ශේෂයක් වූ අතර ඉකුත් වර්ෂ කිහිපයක සිට සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂය පිරිහෙමින් පැවතුණි. විස්තර පහත දැක්වේ.

| වර්ෂය | සමුච්චිත අරමුදල් ශේෂය |
|---|---|
| | රු. |
| 2013 | (3,257,777) |
| 2012 | 5,711,256 |
| 2011 | 9,493,445 |

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000’ | රු.000’ | රු.000’ |
| (i.) | වරිපනම් හා බදු | 1,534 | 1,178 | 521 |
| (ii.) | බදු කුලී | -- | -- | 547 |
| (iii.) | බලපත්‍ර ගාස්තු | 102 | 82 | 42 |

2:3:2 වරිපනම් බදු

2013 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු ශේෂය රු.139,197 ක් වූ අතර ඉන් රු.51,227 ක් 2014 ඔක්තෝබර් 31 දින වන විටද අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

2:3:3 අක්කර බදු

2011 වර්ෂයට පෙර සිට පැවත එන රු.83,984 ක් වූ අක්කර බදු ශේෂය විගණිත දිනය වූ 2014 අගෝස්තු 30 දින වන විටද අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

2:3:4 ව්‍යාපාර බදු

2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපාර ස්ථාන 168 කින් ව්‍යාපාර බදු රු.204,540 ක හිඟ ශේෂයක් පැවති අතර ඉන් රු.132,620 ක ශේෂයක් විගණිත දිනය වූ 2014 අගෝස්තු 30 දින වන විටද අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

2:3:5 කර්මාන්ත බදු

2013 දෙසැම්බර් 31 දිනට හිඟව පැවති රු.72,570 ක් වූ කර්මාන්ත බදු ශේෂයෙන් රු.46,500 ක් විගණිත දිනය වූ 2014 අගෝස්තු 30 උන වන විටත් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

2:3:6 තොටුපල බදු

තොටුපල බදු හිඟ ශේෂය රු.500,716 ක් වූ අතර ඊට 1988 වර්ෂයට පෙර සිට පැවත එන ශේෂය රු.11,863 ක් ද 1989 ට අදාල රු.25,168 ක්ද, 2000 සිට 2008 දක්වා ශේෂය රු.463,685 ක් ද ඇතුලත් විය. එම හිඟ ශේෂයන් අදාල වර්ෂවල අයකර ගැනීමට කටයුතු නොකිරීම නිසා විගණිත දිනය වූ 2014 අගෝස්තු 30 වන විටත් හිඟව පැවතුණි.

2:3:7 බලපත්‍ර ගාස්තු

2013 දෙසැම්බර් 31 දිනට හිඟව පැවති වෙළඳ බලපත්‍ර ගාස්තු ශේෂය වූ රු.41,856 කින් ව්‍යාපාර 28 කට අදාල රු.29,810 ක් විගණිත දිනය වූ 2014 අගෝස්තු 30 දින වන විටද අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

2:3:8 වෙනත් ආදායම්

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතට අනුව කොළඹ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් අය කරනු ලැබූ 2010 වර්ෂයට අදාල රු.99,723 ක් වූ මුද්දර ආදායම් අවුරුදු 03 ක් ඇතුළත ඉල්ලුම් කර නොතිබීම නිසා සභාවට ලබාදීම ප්‍රතික්ෂේප කර තිබුණි.

2.3.9 උසාවි දඩ හා මුද්දර ගාස්තු

--------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 7,841,003 |
| (ii) | මුද්දර ගාස්තු | 1,546,254 |

2.4 මෙහෙයුම්/ කළමනාකරණ අකාර්යක්ෂමතා

--------------------------------------------

(අ) <u>පාඩු හා හානි</u>

2009 වර්ෂයේදී සභාව විසින් දේශීය ණය හා සංවර්ධන අරමුදලෙන් ලබාගෙන තිබූ ණය මුදලේ වාරික 2011 වර්ෂයේ සිට ගෙවිය යුතුව තිබුණද එම වර්ෂයේ සිට නොගෙවා 2013 වර්ෂයේ සිට ගෙවීම ආරම්භ කර තිබීම හේතුවෙන් එම ආයතනය විසින් රු.20,493 ක දඩ පොලී අයකර තිබුණි.

(ආ) <u>විශ්‍රාම වැටුප් අරමුදලට වාරික ගෙවීම</u>

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් 2013 දෙසැම්බර් මාසයේ එවා තිබූ විශ්‍රාම වැටුප් අරමුදල් දායක බිල්පත අනුව 2013 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ශේෂය රු.3,049,837 ක් විය. 2013 වර්ෂයේ ගිණුම් ප්‍රකාශන වල විශ්‍රාම වැටුප් ණයහිමි ප්‍රතිපාදන ලෙස දක්වා තිබුණේ රු.700,000 ක් පමණක් වූ හෙයින් විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතුව තිබූ රු.2,349,837 ක ශේෂයක් ගිණුම්ගතව නොතිබූ බැව් විගණනයේදි නිරීක්ෂණය විය.

(ඇ) <u>ඇඟිලි සළකුණු යන්ත්‍රය මිලදී ගැනිම</u>

2008 පෙබරවාරි 26 දින රු.123,500 කට ඇඟිලි සළකුණු යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) යන්ත්‍රය මිලදීගැනීම සිදු කළ දින සිට විගණිත දින වන 2014 සැප්තැම්බර් 29 දක්වාම අදාල පැමිණීමේ හා පිටවීමේ වේලා සටහන් වල මුද්‍රිත පිටපත් ඇඟිලි සළකුණු යන්ත්‍රයෙන් ලබාගෙන නොතිබුණි.

(ii) 2013 අප්‍රේල් 19 දින වන විට යන්ත්‍රය අක්‍රිය වීම නිසා අළුත්වැඩියා සඳහා සැපයුම් ආයතනය වෙත භාර දී ඇතත් 2014 අගොස්තු මාසය වනවිටත් අදාල අළුත්වැඩියාව සිදු කර යන්ත්‍රය ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) <u>සේවක ණය</u>

සේවය හැර ගිය, විශ්‍රාම ගිය හා මියයැම් වැනි හේතු නිසා සෞඛ්‍ය කම්කරුවකු හා ලිපිකරුවන් ලෙස සේවය කළ සේවකයන් 7 දෙනෙකුගෙන් 2011 වර්ෂයේ සිට අයවිය යුතුව ඇති රු.170,496 ක් වූ ණය ශේෂය 2013 දෙසැම්බර් 31 දිනටද අයකරගෙන නොතිබූ අතර ආයතන සංග්‍රහයේ විධිවිධා ප්‍රකාරව කටයුතු කර මෙම මුදල අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

2:5 <u>ලැබිය යුතු ගිණුම්</u>

වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එමින් පැවත එන රු.17,798 ක් වූ විදුලි ගබඩා ලැබිය යුතු ශේෂය සහ එකතුව රු.855,463 ක් වූ වීථි පහන් ආධාර හා වැටුප් ප්‍රතිපූර්ණ ලැබීම් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

3. පද්ධති හා පාලන

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැයකරණය

(ඇ) ආදායම් පරිපාලනය